(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 29.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 අගෝස්තු 23 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

**ගරු දයා ගමගේ මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා

**ගරු සාගල රත්නායක මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

**ගරු මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

**ගරු මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

**ගරු කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

**ගරු පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වීරකුමාර දිසානායක මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මනූෂ නානායක්කාර මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

**ගරු රවී කරුණානායක මහතා**

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**

**ගරු වේලු කුමාර් මහතා**

**ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

**ගරු චන්දිම ගමගේ මහතා**

**ගරු සිරිපාල ගමලත් මහතා**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රුෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 අගෝස්තු මස 15 වැනි දින **'බද්ධ නිවාස** අයිතිකම් (විශේෂ විධිවිධාන)' සහ 'සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල ද, 2018 අගෝස්තු 16 දින 'එකතු කළ අගය මත බදු (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි ද කථානායකවරයා සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

(2) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික ප්‍රගති වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 11(1)(ආ), 17(2) සහ 31 (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117(2)(එ) වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතා කළමනාකරණ නියෝග සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 05 දිනැති අංක 2065/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 06 දිනැති අංක 2065/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2012, 2013, 2015 සහ 2016 වර්ෂ සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා පිළිගන්වා, එම වාර්තා තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත සහ ප්‍රවාහනය හා සන්නිවේදන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්—

(i) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 1985 දෙසැම්බර් 24 දිනැති අංක 381/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන්;

(iii) 1995 අංක 1 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය සමඟ කියවිය යුතු 24ආ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් ලෙස පිළිගනිමින් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 1995 පෙබරවාරි 23 දිනැති අංක 859/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 1996 ජනවාරි 16 දිනැති අංක 906/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 1998 ඔක්තෝබර් 22 දිනැති අංක 1050/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2000 මාර්තු 03 දිනැති අංක 1121/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධි අධ්‍යායනායතනය පිහිටුවීම සම්බන්ධයෙන් සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, 1987 සැප්තැම්බර් 14 දිනැති අංක 471/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ට කරමින් තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2002 අගෝස්තු 21 දිනැති අංක 1250/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන්; සහ

(viii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2008 ඔක්තෝබර් 10 දිනැති අංක 1570/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම වාර්තාව සහ නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුලි 24

දිනැති අංක 2081/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. **කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත;
(ii) 2012 වර්ෂය සඳහා ලංකාවේ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව;
(iii) 2016 වර්ෂය සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
(iv) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය;
(v) 2017 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
(vi) 2014 සහ 2015 වර්ෂ සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තා;
(vii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ
(viii) 2015 වර්ෂය සඳහා සී/ස ස්වාධීන රූපවාහිනී සේවයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත;
(ii) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන්;
(iii) එකතු කළ අගය මත බදු පනත යටතේ යෝජනාව; සහ
(iv) වාර්ෂික ඇස්තමේන්තු පිළිබඳ හඳුන්වාදීමේ සටහනෙහි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සපයා ඇති අතිරේක ප්‍රතිපාදන පිළිබඳ සටහන

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) වැලිගම, කොහුණුගමුව, පුබුදුජය මාවත, "සතුට" යන ලිපිනයෙහි පදිංචි කේ. පී. සරත් කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2018.05.31 දිනැති පෙත්සම ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) නිට්ටඹුව, කිඹුල්හේන වත්ත, අංක 68/02 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ඒ. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු 2018.06.01 දිනැති පෙත්සම ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) පට්ටියගෙදර, කුරුකුදේ ගම, "ඉඩමේ ගෙදර" යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. ජිනදාස මහතාගෙන් ලැබුණු 2018.06.25 දිනැති පෙත්සම ගරු චමින්ද විජේසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉල්ලා අස්කර ගැනීමේ අවසරය :** ගරු ටී. රංජිත් ද සොයිසා මහතා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 66 වශයෙන් දැක්වෙන පහත සඳහන් පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

යෝජනාව සභාවේ අවසර සහිතව ඉල්ලා අස්කර ගන්නා ලදී.

7. **සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ. භා. 12.47 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය"යි අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.35 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු කේ.කේ. පියදාස මහතා, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා යෝජනා කරමින් ස්ථිර කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.22 ට ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු ඉෂාක් රහුමාන් මහතා, ගරු කේ. කේ. පියදාස මහතා යෝජනා කරමින් ස්ථිර කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.21 ට ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.02 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.34 ට ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.31 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 4 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය''යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**8. අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය''යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය''යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

9 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 7 වැනි පිටුවේ 3 වැනි සහ 4 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> '' හා භාර ගැනීම සඳහා සහ එම උපකරණ ආරක්ෂා කිරීම, ලේඛනාගාරගත කිරීම, පරිපාලනය කිරීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා සියලු ක්‍රියා මාර්ග ගැනීම;'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක් : 8 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> '' අවසන් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ලිඛිත නීති අනුව වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන් වෙත ගෙවීම;'';''

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය සභා සම්මත විය.

11 වැනි වගන්තිය

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක් : 9 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

" දී, ඉටු කිරීමේදී හා සිදු කිරීමේදී කේන්ද්‍රය විසින් දරනු ලබන වියදම් පියවීමට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**9. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 12 දිනැති අංක 2066/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 24 දිනැති අංක 2068/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3)** : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 15 දිනැති අංක 2071/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම (ජපන් ශිෂ්‍යත්ව පිරිනැමීමේ ක්‍රියාවලිය අඩාල වීම) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

''ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතුය''යි සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.48 ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.31 ට 2018 අගෝස්තු 24 වැනි සිකුරාදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.